# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1814/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திகதி<br>Date | 06/12/2024<br>පැය 1445 |

## මාධ්‍ය නිවේදනය

### <u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු</u>

**01. නීති විරෝධි මත්පැන් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මොරටුව කඳවුර.**

2024.12.05 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මොරටුව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කහතුඩුව පොලිස් වසමේ පොල්ගස්ඕවිට ප්‍රදේශයේ වැටලීමක් සිදුකර **නීති විරෝධි මත්පැන් ලීටර් 26.25 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කහතුඩුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක් වන පොල්ගස්ඕවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කහතුඩුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකය**

2024.12.05 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් බොරලැස්ගමුව පොලිස් වසමේ පැපිලියාන ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 604 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන බොරලැස්ගමුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වන දෙහිවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

බොරලැස්ගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකය

2024.12.05 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කොහුවල පොලිස් වසමේ දෙහිවල ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 104 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන කොහුවල පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන ස්ප්‍රින්වැලි ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

කොහුවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. කුඩු මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකය

2024.12.05 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් බොරලැස්ගමුව පොලිස් වසමේ බොරලැස්ගමුව ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **කුඩු මත්ද්‍රව්‍ය ග්‍රෑම් 92 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන බොරලැස්ගමුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 54 ක් වන කොළඹ 02 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

බොරලැස්ගමුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. හෙරොයින් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගාල්ල කඳවුර.

2024.12.05 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගාල්ල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් රත්ගම පොලිස් වසමේ පල්ලියපිටිය ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 50 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු** අත්අඩංගුවට ගෙන රත්ගම පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 39 හා 46 වයස්වල පසුවන රත්ගම ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

රත්ගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. ආලම්කුලම් රජයේ රක්ෂිත ප්‍රදේශයට අනවසරයෙන් අතුළු වී කැලෑ ප්‍රදේශය එළි කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුල්මුඩේ කඳවුර

2024.12.05 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුල්මුඩේ කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කුච්චවේලි පොලිස් වසමේ ආලම්කුලම් ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **රජයේ රක්ෂිත ප්‍රදේශයට අනවසරයෙන් ඇතුළු වී අක්කර ½ ක පමණ ප්‍රමාණයක් එළි පෙහෙළි කරමින් සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන පුල්මුඩේ බීට්ටු වන නිලධාරි වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස 32 ක් වන කුච්චවේලි ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

**07. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මහඔය කඳවුර**

2024.12.05 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මහඔය කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් කරදියනාරු පොලිස් වසමේ කිතුල පෝතාන ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ** තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කරදියනාරු පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 වන කාන්චිරන්කුඩා ප්‍රදේශයේ පදිංචිකරුවෙක් වේ.**

**08. ගංජා පැල සමඟ සැකකරුවන් දහතුන්දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර.**

2024.12.04 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ගෝනගංආර පොලිස් වසමේ යාල රක්ෂිත ප්‍රදේශයේ වැටලීම් දහයක් සිදු කර **වගා කර තිබූ ගංජා පැල 929,420 ක් හා මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවන් දහතුන්දෙනෙකු අත්අඩංගුවට ගෙන** ගෝනගංආර පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 26 හා 46 අතර වයස්වල පසුවන මිද්දෙනිය, ඇතිලිවැව, බුත්තල, කුඩාඔය, වරාපිටිය, කටුවන, සෙල්ලකතරගම හා මාතර ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.** ගෝනගංආර පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**